මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය- 2016

# Primary Piriven Mid-Year Term Test - 2016

1 වසර / Grade 1

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

සිංහල
**Sinhala**

කාලය : පැය දෙකයි
Time : Two hours

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 06කට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 100කට නො අඩු වාක්‍ය රචනයක් ලියන්න.

i. වෙසක් උත්සවය.
ii. මිහිඳු මහරහතන් වහන්සේ.
iii. වැඩිහිටියන්ට කීකරු වෙමු.
iv. උත්සහවන්තයා ජයගනී.
v. මා පැව්දි වූ දා. (ලකුණු 25)

02. (අ.) පහත සඳහන් පදවලට සමානාර්ථ පද ලියන්න.

i. වතුර
ii. අම්මා
iii. පොළොව
iv. හිස
v. ගුවන (ලකුණු 05)

(ආ) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

i. උඩ
ii. සතුරු
iii. රැය
iv. ඉහළ
v. හොඳ (ලකුණු 05)

(ඇ) පහත සඳහන් පදවල ස්ත්‍රීලිංග පද ලියන්න.

i. මාමා
ii. මොනරා
iii. අලියා
iv. බල්ලා
v. කුරුල්ලා (ලකුණු 05)

03. (අ.) **ලිවීමේ දී** වම්පසින් අවසන් වන අකුරකින් පටන්ගන්නා වචන පහක් ලියන්න. (ලකුණු 05)

(ආ.) **ලිවීමේ දී** දකුණු පසින් අවසන් වන අකුරකින් පටන් ගන්නා වචන පහක් ලියන්න. (ලකුණු 05)

(ඇ.) නූතන සිංහල හෝඩියට අයත් ස්වරමාලාව ලියා දක්වන්න. (ලකුණු 05)

04.

ගිරවා, බසය,
සීගිරිය, රජතුමා,
පැන, කාන්තාව,
කුමරා, පුටුව, කඳු,
පාසල, ගෙදර, අමර

(අ.) රවුම තුළ ඇති වචනවලින් සචේතනික නාම පද පහක් තෝරා ලියන්න. (ලකුණු 05)

(ආ.) රවුම තුළ ඇති වචනවලින් අචේතනික නාම පද පහක් තෝරා ලියන්න. (ලකුණු 05)

(ඇ) පහත සඳහන් පද අකාරාදී පිළිවෙළට ලියන්න.

කොරියාව, ඇමරිකාව, ඩක්කුව, නයා, මහියංගනය, සුනිමල්, පාර්ලිමේන්තුව, රාජාංගනය (ලකුණු 05)

05. (අ.) සුදුසු ක්‍රියාපදය තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. කුහුඹුවා වේගයෙන් ගමන් .................................. (කරයි / කරති)
ii. කුරුල්ලෝ අහසේ පියාසර .................................. (කරයි / කරති)
iii. අපි රචනාවක් .................................. (ලියයි / ලියමු)
iv. සරුංගලය වේගයෙන් ඉහළ .................................. (යයි / යති )
v. අක්කා අම්මා සමඟ පොළට .................................. (ගියාය / ගියේය) (ලකුණු 05)

(ආ.) මිශ්‍ර සිංහල අක්ෂර මාලාවේ වර්ගාන්තාක්ෂර සියල්ල ලියා දක්වන්න. (ලකුණු 05)

(ඇ.) නම් පොතෙන් උපුටා ගත් පහත සඳහන් වචනවල හිස්තැන් පුරවන්න.

i. උ ...... රා ...... ල
ii. ...... ජ්පා ...... ඩ
iii. ...... ස් ...... හෙර
iv. සැ ...... ලෙන
v. ස ...... ග ...... වි...... ...... ය (ලකුණු 05)

06. (අ.) පහත සඳහන් කවියේ අදහස ලියන්න.

කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ

දුකකිනි මිනිසත් බව ලැබගන්නේ

මෙදෙකිනි මෙසසර දුක් දුරලන්නේ

සුදනෙනි ! කිම වීරිය නො කරන්නේ (ලකුණු 05)

(ආ.) ලෝවැඩ සඟරාව කෘතියේ කතුවරයා, රචනා කළ කාලය සහ එහි ඇති වැදගත්කම මෙතෙක් උගත් පද්‍ය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. මඩොල්දූව නවකතාවේ ඔබ මෙතෙක් උගත් පරිච්ඡේද ඇසුරින් වඩාත් සිත්ගත් චරිතයක් නම් කොට එසේ සිත් ගැනීමට හේතු දක්වන්න. (ලකුණු 15)

The National e-learning Portal for The General Education